169442

Sri Lanka


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 110/7 — 1980 ඔක්තෝබර් 15 වැනි බදාදා — 1980.10.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 25 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියමාවලිය.

ඩබ්ලිව්. එම්. ඒ. විජේරත්න බණ්ඩා,
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1980 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 1980 අංක 4 දරන ආයතන පිළිගැනීමේ නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර 1980 ඔක්තෝබර් මස 15 වන දින සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

2. (1) පනතේ 25 වන වගන්තිය යටතේ උසස් අධ්‍යාපන ආයතන එකක් හෝ එකකට වැඩි ගණනක් සම්බන්ධයෙන් පිළිගනු ලැබීමට අයදුම් කරන ආයතනයක ප්‍රධාන පරිපාලන නිලධරයා විසින් ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනය වෙනුවෙන් පිටපත් දෙකකින් යුතු ඉල්ලුම් පත්‍රයක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන අනුඡේදයේ සඳහන් කරන ලද සෑම ඉල්ලුම් පත්‍රයක් ම ලේකම්වරයා විසින් ඒ සඳහා නිකුත් කරන ලද ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කළ යුතු ය.

3. (1) ලේකම්වරයා විසින්, 2 වන ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් තමා වෙත ලැබී දින දහහතරක් ඇතුළත, එම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් පිළිගනු ලැබීමට ද, ඒ ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ඒ උසස් අධ්‍යාපන ආයතනයේ නිර්දේශය සඳහා ඒ ඉල්ලුම් පත්‍රයේ එක් පිටපතක් ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන අනුච්ඡේදයේ සඳහන් උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින්, ඒ ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් තමා වෙත ලැබී දින හැටක් ඇතුළත, ඒ ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ඒ උසස් අධ්‍යාපන ආයතනයේ නිර්දේශය තම අත්සන යටතේ වූ ලියවිල්ලකින් ලේකම්වරයා වෙත දැන්විය යුතු ය.

(3) ලේකම්වරයා විසින් (2) වන අනුච්ඡේදයේ සඳහන් නිර්දේශය තමා වෙත ලැබුණාට පසු, (2) වන ඡේදය යටතේ තමා වෙත ලැබුණා වූ ඒ ඉල්ලුම් පත්‍රයේ පිටපතක්, 3 වන ඡේදය යටතේ ඒ ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් කරන ලද නිර්දේශය සමග හැකිතාක් ඉක්මණින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. (1) පනතේ 25 වන වගන්තිය යටතේ පිළිගනු ලැබීම සඳහා අයැදුම් කරන යම් ආයතනයක් පිළිගනු ලැබීමට හෝ පිළිගනු නොලැබීම සඳහා සුදුසු දැයි නිශ්චය කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ හෝ විමර්ශණ පැවැත්වීමට හෝ පැවැත්වීමට සැලැස්වීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි අතර කොමිෂන් සභාවට අවශ්‍ය යැයි සළකනු ලබන විස්තර ඉල්ලා සිටීමට ද බලය ඇත්තේ ය.

(2) (1) වන අනුච්ඡේදයේ කාර්යය සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම හා අවශ්‍ය යැයි සළකනු ලබන එම තොරතුරු සැපයීම, 25 වන වගන්තිය යටතේ පිළිගනු ලැබීම අපේක්ෂා කරන සෑම ආයතනයකම යුතුකම වන්නේ ය.

1 A– ඒ 52036—3,200 (80/10)

5. (1) පනතේ 25 වන වගන්තිය යටතේ යම් ආයතනයක් පිළිගැනීම හෝ නොපිළිගැනීම නිශ්චය කිරීමේදී එම ආයතනයේ ඇති පහත සඳහන් අවම පහසුකම් කොමිෂන් සභාවේ නිසි සැලකිල්ලට භාජනය කරනු ලැබිය හැකි ය:—

(අ) පිළිගනු ලැබීම ඉල්ලුම් කරන ආයතනයේ සේවා නියුක්තයන්ව සිටින අධ්‍යයන සහ අනධ්‍යයන යන දෙයාකාරයේම කාර්ය මණ්ඩලය සහ ඒ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අවම සුදුසුකම් ;

(ආ) එම ආයතනයෙහි ඇති පංති කාමර, පුස්තකාල, රසායනාගාර හා උපකරණ ඇතුළුව පවතින වෙනත් භෞතික සම්පත් ; සහ

(ඇ) කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයන්ට එම ආයතනය විසින් සලසා ඇති පහසුකම් :

එසේ වුව ද, පිළිගනු ලැබීමට අයැදුම් කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් ද, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ නිර්දේශය සහ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස කිසිම ආයතනයක් පිළිගනු නොලැබිය යුතු ය.

6. (1) 5 වන ඡේදය යටතේ යම් ආයතනයක් පිළිගනු ලැබීම හෝ නොපිළිගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන අතර ඒ තීරණය ඒ ආයතනයට ලිඛිතව දැනුම් දිය යුතු ය. පිළිගනු ලැබීම සඳහා කරනු ලැබ ඇති අයැදුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, ඒ ප්‍රතික්ෂේප කිරීමට හේතු කොමිෂන් සභාව විසින් සඳහන් කළ යුතු ය.

(2) පිළිගනු ලැබීම සඳහා ඉල්ලුම් පත්‍රයක් (1) වන අනුච්ඡේදය යටතේ ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, (1) වන අනුච්ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් සඳහන් කර ඇති හේතු සැලකිල්ලට භාජනය කරමින් අවශ්‍ය විය හැකි වෙනත් වැඩ පිළිවෙළක් යෙදීමෙන් හෝ ප්‍රතිසංවිධානය කිරීමෙන් පසු යම් ආයතනයක් විසින් පනතේ 25 වන වගන්තිය යටතේ පිළිගනු ලැබීමට ඉල්ලුම් පත්‍රයක් නැවතත් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

7. පනතේ 25 වන වගන්තිය යටතේ පිළිගනු ලැබූ ආයතනයකට, එම පිළිගැනීම කරනු ලැබුවේ යම් කොන්දේසිවලට යටත්ව ද, එම කොන්දේසි ද, ඒ කොන්දේසි ඒ ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට සහ ශිෂ්‍යයන්ට දැන්විය යුතු ආකාරය ද කොමිෂන් සභාව විසින් දැනුම් දිය යුතු ය.

8. (1) පනතේ 25 වන වගන්තිය යටතේ පිළිගනු ලැබූ ආයතනයක් විසින් (මින්මතු "පිළිගත් ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සලසනු ලබන පහසුකම් සම්බන්ධව විමර්ශන පැවැත්වීම හෝ විමර්ශන පැවැත්වීමට සළස්වනු ලැබීම කොමිෂන් සභාව විසින් කලින් කල කරනු ලැබිය හැකි අතර එවැනි විමර්ශනයක් පැවැත්වීමට සෑම පහසුකමක් ම සැලැස්වීම එවැනි ආයතනයක යුතුකම වන්නේ ය.

(2) (1) වන අනුච්ඡේදය යටතේ පවත්වනු ලැබූ යම් විමර්ශනයකින් පසු පිළිගනු ලැබූ යම් ආයතනයක් විසින් සපයන ලද පහසුකම්වල යම් ඌනතාවක් ඇති බව කොමිෂන් සභාවේ මතය වන්නේ නම්, කොමිෂන් සභාව විසින් එම ඌනතාව ඒ ආයතනයට දැන්විය යුතු අතර එම ඌනතාව සම්පූර්ණ කරන ලෙස එම ආයතනයට විධානය කළ යුතු ය.

(3) (2) වන අනුච්ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් එවැනි ඌනතාවක් සම්පූර්ණ කරන ලෙස විධානය කරනු ලැබූ යම් ආයතනයක් සාධාරණ හේතුවක් නොමැතිව එසේ කිරීමට අපොහොසත් වුවහොත් පනතේ 25 වන වගන්තිය යටතේ එම ආයතනයට පිරිනමන ලද පිළිගැනීම, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාවට අස් කර ගත හැකි ය.

9. (1) (2) වන අනුච්ඡේදයේ විධිවිධානවලට යටත්ව පිළිගනු ලැබූ සෑම ආයතනයක් විසින් ම, ඒ පිළිගැනීම කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් ද, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ විභාග වෙනුවෙන් අනුමත කරන ලද්දා වූ අධ්‍යයන පාඨමාලා හැදෑරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීම සඳහා කලින් කල නියම කරනු ලැබූ අවම සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශිෂ්‍යයන් පමණක් බඳවා ගත යුතු ය.

(2) පනතේ 30 වන සහ 31 වන වගන්ති පිළිගත් ආයතනයකට සහ ආයතනයක් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

10. පිළිගත් ආයතනයකට 9 වන ඡේදය යටතේ ඇතුළත් කර ගන්නා ලද ශිෂ්‍යයන්ගේ විනය සම්බන්ධයෙන් එක් එක් ආයතනය වගකිව යුතු වන්නේ ය.

එසේ වුව ද, යම් ශිෂ්‍යයකුට යම් උසස් අධ්‍යාපන ආයතනයක දී අධ්‍යයන පාඨමාලා හෝ අධ්‍යයන පාඨමාලාවක කොටසක් හැදෑරීමට අවසර දී ඇති අවස්ථාවක ඒ ශිෂ්‍යයා ඒ උසස් අධ්‍යාපන ආයතනයේ සීමාවන් තුළ රැඳී සිටින තාක් ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ විනය පාලනයට යටත් වන්නේ

11. පිළිගනු ලැබූ සෑම ආයතනයක් විසින් ම, 9 වන ඡේදය යටතේ ඒ ආයතනයට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍යයන්ගෙන් එම ආයතනයට උචිත යැයි සළකනු ලැබිය හැකි ගාස්තු අයකර ගනු ලැබිය හැකි ය.

එසේ වුව ද, පිළිගත් ආයතනයක අරමුදලට ආණ්ඩුව පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මුදල් සපයන අවස්ථාවක, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් ලිඛිතව දෙන ලද පූර්ව අනුමතිය ඇතිව මිස එම ආයතනය ගාස්තු අය නොකළ යුතු ය.

12. යම් ආයතනයක් පිළිගනු ලැබ ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් ද, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ අනුමත කරනු ලැබූ අධ්‍යාපන පාඨමාලා සඳහා නියම කරනු ලැබූ විෂයය නිර්දේශ මාලාවන්ට අනුකූලව සෑම පිළිගත් ආයතනයක් විසින් ම ඒ උසස් අධ්‍යාපන ආයතනයේ විභාග සඳහා අනුමත කරනු ලැබූ අධ්‍යයන පාඨමාලා පැවැත්විය යුතු ය.

13. (1) යම් ආයතනයක් පිළිගනු ලැබුවේ යම් උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් ද, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ එකඟත්වය ඇතිව ඒ ආයතනයේ ශිෂ්‍යයන්ට, අනුමත කරනු ලැබූ අධ්‍යයන පාඨමාලා හෝ පාඨමාලාවක කොටසක් ඒ උසස් අධ්‍යාපන ආයතනයෙහි දී හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක දී හැදෑරීමට, අවශ්‍ය වැඩ පිළිවෙළක් යෙදීමේ බලය, පිළිගනු ලැබූ ආයතනයකට ඇති අතර එවැනි වැඩ පිළිවෙළක් යටතේ හදාරනු ලැබූ අධ්‍යයන පාඨමාලාවක් හෝ පාඨමාලාවක කොටසක් මෙම නියමාවලිය යටතේ හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක් යටතේ කාර්ය සඳහා ඒ පිළිගත් ආයතනයේ දී හදාරන ලද අධ්‍යයන පාඨමාලාවක් හෝ අධ්‍යයන පාඨමාලාවක කොටසක් ලෙස සැළකිය යුතු ය.

(2) පිළිගනු ලැබූ අයතනයක ශිෂ්‍යයන් විසින් (1) වන අනුච්ඡේදයේ විධිවිධාන යටතේ අනුමත කරනු ලැබූ අධ්‍යයන පාඨමාලා හෝ පාඨමාලාවක කොටසක් හැදෑරීමේ දී යටත් විය යුතු ගාස්තු ඇතුළු වූ නියමයන් හා කොන්දේසි, එම ආයතනය පිළිගනු ලැබුවේ යම් උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් ද, ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින් කලින් කල නියම කරනු ලැබිය යුතු අතර යම් අධ්‍යයන පාඨමාලා හෝ අධ්‍යයන පාඨමාලාවක කොටසක් වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක දී හැදෑරීමට වැඩ පිළිවෙළක් යොදා ඇති අවස්ථාවක දී, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ එකඟත්වය ඇතිව ඒ නියමයන් හා කොන්දේසි පැනවිය යුතු ය.

14. යම් ආයතනයක් පිළිගනු ලැබ ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් ද, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ උචිත විභාගවලට ඒ ආයතනයේ සුදුසුකම් ලත් සෑම ශිෂ්‍යයකුම පෙනී සිටිය යුතු අතර ඒ විභාග ඒ සඳහා විධිවිධාන සලස්වන යම් උචිත සාධන පත්‍රයකට අනුකූලව පැවැත්විය යුතු ය. මෙම ඡේදයේ කාර්යය සඳහා "පිළිගත් ආයතනයක සුදුසුකම් ලත් ශිෂ්‍යයා" යන්නෙන්—

(1) 9 වන ඡේදයේ විධිවිධාන යටතේ ඒ ආයතනයට විධිමත් පරිදි ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ ද;

(2) ඒ ආයතනයේ ශිෂ්‍යයකු වශයෙන් ලේඛනාරූඪ කර ඇත්තා වූ ද;

(3) එසේ ලේඛනාරූඪ කිරීමෙන් පසු තමා පෙනී සිටිමට බලාපොරොත්තු වන විභාගය සම්බන්ධයෙන් අදාළ උසස් අධ්‍යාපන ආයතන විසින් පනවන ලද කාලසීමාවට නො අඩු වූ කාල පරිච්ඡේදයක් තුළ ඒ විභාගය සඳහා අනුමත කරන ලද අධ්‍යාපන පාඨමාලාවක් ඒ ආයතනයේ දී හදාරා ඇත්තා වූ ද;

ශිෂ්‍යයකු අදහස් කළ යුතු ය.

15. මේ නියමාවලියෙහි—

"පනත" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ.

"උචිත සාධන පත්‍රය" යන්නට පනතේ දී ඇති අර්ථයම විය යුතු ය.

"අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා" යන්නට යම් පිළිගත් ආයතනයක් විසින් එම ආයතනයේ පිළිගැනීම අදාළ උසස් අධ්‍යාපන ආයතනයට නිර්දේශ කරන ලදුව එම උසස් අධ්‍යාපන ආයතනය විසින් අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා ඇතුළත් වේ.

"කොමිෂන් සභාව" යන්නට පනතේ දී ඇති අර්ථයම විය යුතු ය.

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නට පනතේ දී ඇති අර්ථයම විය යුතු ය.

"ප්‍රධාන විධායක නිලධරයා" යන්නට පනතේ දී ඇති අර්ථයම විය යුතු ය.

"ලේකම්වරයා" යන්නෙන් පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී